PTF/01/Circular/01
2020.04.29

චක්‍රලේඛ අංකය : PTF/03/2020 (v)

**සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්**
**සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත**

**උද්ගත වී ඇති ව්‍යසනකාරී තත්ත්වය නිසා සමාජ ප්‍රතිලාභ වැඩසටහන යටතේ පොරොත්තු ලේඛන ගත කර ඇති ප්‍රතිලාභීන් සඳහා රු.5000/-ක දීමනාවක් ගෙවීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති අංක PTF/03/2020 හා 2020.03.31 දිනැති සහ අංක PTF/03/2020 (iv) හා 2020.04.20 දිනැති චක්‍රලේඛ සහ ඊට අනුෂාංගික චක්‍රලේඛ මඟින් ලබා දී ඇති උපදෙස්වලට වැඩිමනත් වශයෙනි.

02. ඉහත සඳහන් චක්‍රලේඛ අනුව දැනටමත් ප්‍රතිලාභීන් තෝරා ගැනීම සිදු කර ඇතත්, පහත සඳහන් ක්ෂේත්‍රයන්හි රැකියාවල නියුතු පුද්ගලයින් සිටින පවුල් සඳහා රු.5000/- දීමනාව ගෙවීමේ දී මතු වී ඇති ප්‍රායෝගික ගැටළු නිසා සැබෑ වශයෙන්ම දීමනාව ලැබිය යුතුව තිබූ ඇතැම් පවුල් වලට මෙම දීමනාව නොලැබී ඇති බවට වාර්තා වී ඇත.

I. රැකියා සඳහා විදේශගත වූ පුද්ගලයින් සිටින පවුල්
II. ඇඟළුම් ඇතුළු විවිධ පෞද්ගලික අංශයේ රැකියාවන්හි නියුතු පුද්ගලයින් සිටින පවුල්
III. වැවිලි ක්ෂේත්‍රයේ රැකියාවන්හි නියුතු පුද්ගලයින් සිටින පවුල්

03. අංක PTF/03/2020 (iv) හා 2020.04.20 දිනැති චක්‍රලේඛය ප්‍රකාර ව, රැකියා සඳහා විදේශගත වූ පුද්ගලයින් සිටින පවුල් ඒකකවල විදේශ ගත වූ සාමාජිකයා/ සමාජිකයින් තම පවුල් ඒකකය වෙත මුදල් නොඑවන ලද බවට හා පෙර මුදල් ඉතුරුම් නොමැති බවට තහවුරු කරගැනීම සඳහා තමා විසින්ම සකස් කර ගන්නා ලද ප්‍රකාශයක් ඉදිරිපත් වූ විටෙක, ප්‍රතිලාභ ලැබීමට සුදුසු යැයි ග්‍රාමීය කමිටුව තීරණය කරනු ලබන්නේ නම්, එසේ ප්‍රතිලාභ ගෙවීමට සලකා බැලිය හැකි ය.

04. තවද, ඇඟළුම් ඇතුළු විවිධ පෞද්ගලික අංශයේ රැකියාවන් හි නියුතු පුද්ගලයින් සිටින පවුල් ඒකක සඳහා අප්‍රේල් මස වැටුප් ලබා නොගත් බවට හෝ ගෙවන ලද වැටුප රු.5000/=ට වඩා අඩු බවට තහවුරු කර ගැනීම සඳහා තමා විසින්ම සකස් කර ගන්නා ලද ප්‍රකාශයක් ඉදිරිපත් වූ විටෙක, ප්‍රතිලාභ ලැබීමට සුදුසු යැයි ග්‍රාමීය කමිටුව තීරණය කරනු ලබන්නේ නම්, එසේ ප්‍රතිලාභ ගෙවීමට සලකා බැලිය හැකි ය.

05. එසේම, වැවිලි ක්ෂේත්‍රයේ අනියම්/ආදේශක/තාවකාලික පදනමින් සේවය කරන, සිය දෛනික/මාසික ආදායම අහිමි වූ පවුල් ඒකක සඳහා දීමනාව ලබාදීමේ දී, තමා විසින්ම සකස් කරගන්නා ලද ප්‍රකාශයක් ග්‍රාමීය කමිටුව වෙත ඉදිරිපත් වූ විටෙක, ප්‍රතිලාභ ලැබීමට සුදුසු යැයි ග්‍රාමීය කමිටුව තීරණය කරනු ලබන්නේ නම්, එසේ ප්‍රතිලාභ ගෙවීමට සලකා බැලිය හැකි ය.

**ඇන්ටන් පෙරේරා**

අග්‍රාමාත්‍ය අතිරේක ලේකම්

සම ලේකම් - ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම

සඳහා වන ජනාධිපති කාර්යසාධන බලකාය

පිටපත්:

01. ජනාධිපති ලේකම්
02. අමාත්‍ය මණ්ඩල ලේකම්
03. විගණකාධිපති

(01–03: කාරුණික දැන ගැනීම සඳහා)

04. ලේකම්, මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
05. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
06. ලේකම්, කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය
07. අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

(04–07: අවශ්‍ය කටයුතු සඳහා)